# රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යය 2021
# විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතා - Collectanea – e book

- **විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතා (Collectanea – e book) යනු කුමක්ද?**

  ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ සංස්කෘතික කමිටුව මගින් පළ කිරීමට අපේක්ෂිත විද්‍යුත් විමර්ශන ලිපි එකතුවකි. මෙය 2021 වසරේ අවසානයේදී ප්‍රකාශ කිරීමට නියමිතය.

- **විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතා (Collectanea – e book) කුමක් සඳහාද?**

  මෙවර මෙය පළ කරනු ලබන්නේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලබන රන්රසු කලා මංගල්‍යය වෙනුවෙනි. පීඨයේ සිසු සිසුවියන්ගේ නිර්මාණශීලි ශක්‍යතා මෙන් ම ඔවුන්ගේ ලේඛන විමර්ශන ශක්‍යතා ඉස්මතු කරවීම, මෙවර කලා මංගල්‍යය මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව සිසු සිසුවියන්ගේ ලේඛන විමර්ශන ශක්‍යතා උද්දීපනය කරවීම මෙහි ප්‍රධාන අරමුණයි. කොවිඩ් වසංගතය හමුවේ උදා වු නව අභියෝග සහිත අනාගතයට සාර්ථකව මුහුණ දීමට මාවතක් විවර කර දීම මෙන්ම දැනුම සහ දැනුම් භාවිතය අතර පවතින පරතරය සීමා කිරීම මෙහි අවශේෂ අරමුණු වේ.

- **මෙහි කර්තෘවරු කවුරුහු ද?**

  මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ දැනට ඉගෙනුම ලබන විද්‍යාර්ථීන්

- **විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතාවේ (Collectanea – e book) මාධ්‍ය කුමක්ද?**

  ඉංග්‍රිසි, සිංහල හා දෙමළ

- **විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතාවේ (Collectanea – e book) පළ කිරීමට නියමිතව ඇත්තේ කුමනාකාරයේ ලිපිද?**

  - මේ සඳහා පාදක කර ගත යුතු වන්නේ ශ්‍රී ලාංකේය සාහිත්‍ය කලා ප්‍රවර්ග (එනම්, නවකතා, කෙටිකතා, ගීත, කවි, චිත්‍රපට, ටෙලි නාට්‍ය, නැටුම්, සංගීතය...) ආදිය යි. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවලින් නිර්මාණය වී ඇති ඕනෑම සාහිත්‍ය-කලා ප්‍රවර්ගයක් මේ සඳහා භාවිත කළ හැකිය.
  - විද්‍යාර්ථීන් තමා ඉගෙන ගන්නා විෂය ධාරාවල (උපාධිය සඳහා පාදක වන විෂයයන්වල) දෘෂ්ටිකෝණයෙන් යුතුව උක්ත සාහිත්‍ය-කලා ප්‍රවර්ග යටතේ මෙම ලේඛන විමර්ශන ලිපි සම්පාදනය කළ යුතු වේ.
    නිදසුන් -
    1. ඉතිහාසය විශේෂවේදී සිසුන්ට - විජයබාකොල්ලය නවකතාව ඇසුරින් ක්‍රි. ව. 1521 සිදු වූ ඓතිහාසික සිද්ධිය විමර්ශනය කිරීම

2. ආර්ථිකවිද්‍යා විශේෂවේදී සිසුන්ට - සද්ධර්මරත්නාවලිය, ජාතක කතා පොත වැනි සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලින් හෙළිවන භාණ්ඩ හුවමාරු ක්‍රමය මත පදනම් වූ වෙළඳාම විමර්ශනය කිරීම
3. තොරතුරු තාක්ෂණ විශේෂවේදී සිසුන්ට - විද්‍යා ප්‍රබන්ධවල භාවිත නව තාක්ෂණික මෙවලම් හෝ ක්‍රම නිසා මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරු විමර්ශනය කිරීම

- **ඉදිරිපත් කරන සියලුම ලිපි පළ කරන්නේ ද ?**

  - අප වෙත එවන ලබන සියලුම ලේඛන විමර්ශන ලිපි පීය සංස්කෘතික කමිටුව විසින් පත් කරන ලද සමාලෝචන මණ්ඩලයක පරීක්ෂාවට ලක් වේ. මෙහිදී එම ලිපිවල සාවද්‍ය-නිරවද්‍ය බව, අදාළත්වය, භාෂා භාවිතය හා භාෂා නිරවද්‍යතාව යන කරුණු පිළිබඳ අවධානය යොමු කෙරේ. ඒ අනුව සංස්කරණය සහිතව හෝ රහිතව සමාලෝචන මණ්ඩලය සුදුසු යැ'යි තෝරාගත් ලිපි මෙම විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතාවේ පළ කෙරේ.

  - එක් අයෙකුට ලේඛන විමර්ශන ලිපි ඕනෑම ගණනක් ඉදිරිපත් කළ හැකි වේ. එහෙත් ඒ ලේඛන විමර්ශන ලිපි මීට පෙර කිසිදු විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍යයක ප්‍රකාශයට පත් නොකළ ඒවා විය යුතු වන අතර ඒ බව ලේඛන විමර්ශන ලිපියේ කතුවරුන් සහතික කළ යුතු වේ.

- **විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතා (Collectanea – e book) සඳහා ලිපි සකස් කළ යුත්තේ කෙසේද?**

  - උපරිම වචන සීමාව - 2000 සිට 4000 (සියලුම වචන)
  - භාෂාව - සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි
  - පළ කරන ලිපි ප්‍රමාණය - සීමාවක් නැත
  - එක් අයෙකුට ඉදිරිපත් කළ හැකි ලිපි ගණන - සීමාවක් නැත
  - ලිපි භාරගන්නා අවසන් දිනය - 2021 ජනවාරි 22
  - ලිපි එවිය යුතු විද්‍යුත් ලිපිනය - collectaneafhss@gmail.com
  - පරිගණක අක්ෂර වර්ගය - Times New Roman (ඉංග්‍රීසි)<br>FMAbhaya (සිංහල)<br>Bamini (දෙමළ)
  - පරිගණක අක්ෂර ප්‍රමාණය - 12
  - පේළි පරතරය - 1.0

- **පෙළගැස්ම**

  - මාතෘකාව - උපරිම වචන 20
  - සංක්ෂේපය - වචන 150කි. මෙම වචන 150ට විමර්ශනයේ අරමුණ, පදනම් වූ ලේඛනය, කර්තෘගේ නම, විෂයය ආදිය ඇතුළත් කළ යුතුය.

- විමර්ශනය සඳහා කුමන භාෂාව උපයෝගී කර ගත්තද සංක්ෂේපය ඉංග්‍රීසි භාෂාවෙන් ලිවිය හැකි නම් වඩාත් සුදුසු ය.
- හැඳින්වීම - විමර්ශනය සඳහා පාදක වූ ලේඛනය (නවකතාව, කෙටිකතා, කවි, චිත්‍රපටය ආදී වශයෙන්) ගැන හැඳින්වීමක්ද මීට ඇතුළත් කළ යුතුය.
- සාකච්ඡාව - සමස්ත ලිපිය සඳහා භාවිත වන වචන සංඛ්‍යාවෙන් 50% වචන සංඛ්‍යාවක් මීට ඇතුළත් විය යුතුය.
- නිගමනය
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය
- අවසන් සටහන් (තිබේ නම් පමණක්)
- ප්‍රකාශය - මෙම විමර්ශනය කිසියම් පුද්ගලයකුට හෝ සිද්ධියකට අයත් නොවන බවටත්, ඉන් කිසිවකුටත් මානසික හෝ ශාරීරික හානියක් සිදු නොවන බවටත්, ග්‍රන්ථ චෞරත්වයට අයත් නොවන බවටත් සහතික කරමින් කර්තෘ විසින් සිදු කරනු ලබන ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු වේ.
- ස්තුතිය (තිබේ නම් පමණක්)
- විමර්ශනයට අදාළ ඡායාරූප, රූප සටහන් (තිබේ නම් පමණක්)

- මෙහි ප්‍රකාශන අයිතිය සතු වන්නේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයට යි.

- ලේඛන විමර්ශන ලිපිය හෝ ලිපි සමග ඔබගේ තොරතුරු ඇතුළත් කර අප වෙත එවිය යුතු අයදුම්පත මේ සමග මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ වෙබ් අඩවියේ දැක්වේ. සියලු දෙනාම අයදුම්පත සම්පූර්ණ කළ යුතු වන්නේ ***ඉංග්‍රීසි මාධ්‍යයෙන්*** පමණි.

- ඔබගේ අයදුම්පත සමග පමණක් ලේඛන විමර්ශන ලිපි එවිය යුතු බවත්, එය අපගේ විද්‍යුත් ලිපිනයට පමණක් එවිය යුතු බවත් සලකන්න.

- මෙසේ නිර්මාණය වූ විද්‍යුත් ලේඛන විමර්ශන සංහිතා (Collectanea – e book) රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යයේදී එළි දැක්වේ.

- තවද මෙකී ලේඛන විමර්ශන ලිපි රචනය සම්බන්ධයෙන් විද්වතුන්ගේ අදහස්ද මීට සමගාමී ව පීඨ වෙබ් අඩවිය මගින් සිසු සිසුවියන්ට ලබා දීමට නියමිතය.